# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1966/21 - 2016 මැයි මස 11 වැනි බදාදා - 2016.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය.*: අනු/4/5/3/7/6.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/9/2012/WS/252.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :***

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැදෑ කෝරළේ සුළු කොට්ඨාසයේ, රඹෑව ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2016.01.28 දිනැතිව මැන සකස් කරන ලද, අවසාන ගම් පිඹුරු අංක 157 අතිරේක අංක 29 හා පත්‍ර අංක 31 දරන පිඹුරේ, කැබලි අංක 718 වශයෙන් දැක්වෙන "රඹෑව කැලේ" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4856 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංක 718**

ඉඩමේ නම: රඹෑව කැලේ; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනයන් : තුඩුවගේ ජේන් නෝනා මහත්මිය, අංක 251, මිහින්තලේ පාර, රඹෑව; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.4856.

***මායිම් :***

*උතුරට*: කැබලි අංක 226; *නැගෙනහිරට*: කැබලි අංක 225; *දකුණට*: කැබලි අංක 719; *බටහිරට*: කැබලි අංක 227.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූනි මස 08 වැනි දින පෙ.ව. 10.00 ට, රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඒ. එම්. ඩබ්ලිව්. ඒ. අමුණුගම,
ප්‍රාදේශීය ලේකම්,
රඹෑව.

2016 මැයි මස 03 වැනි දින,
රඹෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 841

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය.*: ඉ/4/7.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/9/2013/WS/505.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23427 - 22 - (2016/05)

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුකහ බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1033, හඳපාන්ගල ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2016.02.24 දිනැතිව මැන සකස් කරන ලද, අවසාන ගම් පිඹුරු අංක 568 අතිරේක අංක 5 හා පත්‍ර අංක 6 දරන පිඹුරේ කැබලි අංක 123 වශයෙන් දැක්වෙන "ගල්හේනකන්ද මූකලාන" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0759ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංක 123**

ඉඩමේ නම: ගල්හේනකන්ද මූකලාන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : රණසිංහ මුදියන්සේලාගේ අබේසිංහ, (මියගොස් ඇත), පුහුලේ විහාරය හංදිය අසල, හඳපාන්ගල, ගිරිඋල්ල සහ තවත් අය; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0759.

***මායිම් :***

*උතුරට*: 32 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 122 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 122 සහ 124 වැනි බිම් කැබැලි; *බටහිරට*: 124 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 10.00 ට, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජූලි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කල යුතුය.

එම්. ඒ. ආර්. සුදර්ශනී,  
ප්‍රාදේශීය ලේකම්,  
නාරම්මල.

2016 මැයි මස 06 වැනි දින,  
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 847

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.